# මාසික
# විවරණිකාව

**2012 නොවැම්බර්**



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

62 වැනි වෙළුම   11 වැනි කලාපය

**2012 නොවැම්බර්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01.**

## පටුන

පිටුව


I වන කොටස - මාසික සිදුවීම් .......... .......... 05

II වන කොටස - පුවත්පත් නිවේදන - 2012 නොවැම්බර් .......... .......... 06

1. විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය - 2012 සැප්තැම්බර් .......... .......... 07
2. ශ්‍රී ලංකා ජපාන රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවයට හැට වසරක් පිරීම සැමරීම නිමිත්තෙන් නිකුත් කරනු ලබන සමරු කාසිය .......... .......... 10
3. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 නොවැම්බර් .......... .......... 12
4. 2012 නොවැම්බර් මාසයේ දී උද්ධමනය ඉහළ නඟී ........... .......... 13
5. කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) ........... .......... 14

## 1 වන කොටස
# මාසික සිදුවීම්
## 2012 නොවැම්බර්

**රාජ්‍ය මූල්‍ය අංශය**

- කිරි නිෂ්පාදන, කුරුළු බිත්තර, සත්ව මූලමය ආහාරයට සුදුසු නිෂ්පාදන, කැපූ මල් සහ මල් කැකුළු, කොළ අතු, අළුත්/කල් තබා ගැනීමට පිළියෙල කළ/වියළි එළවළු සහ පළතුරු, අනෙකුත් එළවළු සහ පළතුරු, ආහාරයට සුදුසු තෙල්, මාගරින්, ලිංගුස් සහ කල් තබා ගැනීමට පිලියෙල කළ මාංශ නිෂ්පාදන, රසකැවිලි, බේකරි නිෂ්පාදන, සකස් කළ ආහාර, ඛනිජ ජලය, විනාකිරි, ලුණු, සබන්, මැලියම් වර්ග, දත් බුරුසු සඳහා මිට, මෝටර් රථ සහ සැහැල්ලු ට්‍රක් රථ සඳහා ටයර්, සබන් දවටන, රෙදි වර්ග, වානේ සහ පෙරසවි ගොඩනැගිලි ආනයනය කිරීමේදී අයකළ සෙස් බද්ද වැඩි කරන ලදී.

- ටැක්සි මීටර, රේඩියේටර් සහ කොටස්, ඇලුමිනියම් වයර්, ගෝස් සහ වෙළුම් පටි, තෙත් පිහන කඩ, පොටි, ලිහිසි ද්‍රව්‍ය සහ පැණි හා හකුරු ආනයනය සඳහා සෙස් බද්ද පනවන ලදී

- ජල භාවිතය අවම සනීපාරක්ෂක උපකරණ සහ ගෝනි නූල් වලින් වියූ රෙදි වර්ග ආනයනය සඳහා සෙස් බද්ද අඩු කරන ලදී.

- බඩ ඉරිඟු වලින් නිෂ්පාදිත පොතු හරින ලද හා අඹරන ලද ධාන්‍ය සහ ස්වාභාවික පැණි ආනයනය සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.

- කුරුඳු, කරාබු නැටි, ස්වාභාවික වැලි, තිරුවානා, මැටි, පොස්පේට්, ගල් (එමරි, කොරන්ඩම්, බොරළු, ගල්), තලාතු මිනිරන්, ස්ටීටයිට්, අනෙකුත් ඛණිජ, ඉල්මනයිට්, රූටයිල්, ටයිටේනියම්, සර්කෝනියම්, නයෝබියම්, ටැන්ටලම් සහ වැනේඩියම් අපනයනය සඳහා සෙස් බද්ද වැඩි කරන ලදී.

- කිරිපිටි ආනයනයේදී තීරු බදු අතහැරීම සියයට 15 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 18 දක්වා අඩු කරන ලදී.

- බඩ ඉරිඟු පිෂ්ටය, කඩදාසි පල්ප අච්චු හෝ තෙරපීමෙන් නිෂ්පාදිත භාණ්ඩ සහ මුද්‍රණ හෝ ග්‍රැපික් කටයුතු සඳහා ආලේපිත කඩදාසි ආනයනය සඳහා තීරු බද්ද අඩු කරන ලදී.

- යකඩ හෝ වානේ වලින් නිමකළ නිර්මාණ, මෝල්ට් වලින් නිෂ්පාදිත බීර, ස්ප්‍රීතු, ආසුත වයින් හෝ මිදි පෙරීමෙන් ලබා ගන්නා ස්ප්‍රීතු වර්ග, විස්කි, රම්, ජින් හා ජිනීවා, වොඩ්කා, ලිකර් සහ කෝඩියල් ආනයනය සඳහා තීරු බද්ද වැඩි කරන ලදී.

- රබර් වලින් නිම වූ වායු ටයර්, තෙත් පිහන කඩ සහ ආලෝකකරණය කිරීමට සූර්යාලෝකය අවශෝෂණය කරන උපකරණ ආනයනය සඳහා තීරු බද්ද හඳුන්වාදෙන ලදී.

- ජල භාවිතය අවම සනීපාරක්ෂක භාණ්ඩ, වීදුරු පබළු සහ පොලියෙස්ටර් රෙසින ආනයනය තීරු බද්දෙන් නිදහස් කරන ලදී.

- ත්‍රී රෝද රථ, මෝටර් කාර් (එන්ජින් ධාරිතාව 1,000ට අඩු), ට්‍රක් රථ, තනි කැබ් රථ, ආසුත ජලය, පයිප්ප දුම්කොළ සහ අවමංගල්‍ය රථ සඳහා නිෂ්පාදන බදු සංශෝධනය කරන ලදී.

- රේසිං කාර් යටතේ වර්ගීකරණය කරන ලද "ගෝ කාර්ට්ස්" ආනයනය නිෂ්පාදන බද්දෙන් ඉවත් කරන ලදී.

- උම්බලකඩ, කව්පි, කුඩු කළ හෝ ඇඹරූ මිරිස්, කුඩු කළ හෝ ඇඹරූ කොත්තමල්ලි, සූදුරු බීජ, කුඩු කළ කහ, පොතුහරින ලද රට කජු, අබ ඇට, ටින් මාළු, මිදි සහ පාම් තෙල් ආදිය ආනයනය සඳහා මාස හතරක කාලයකට ක්‍රියාත්මක වන පරිදි විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වැඩි කරන ලදී.

- සූර්ය බලශක්ති ඒකක උපාංග හෝ සූර්ය බලශක්ති ගෘහස්ත පද්ධති, නොමිලේ සෞඛ්‍ය සේවා සපයන ආයතනයකට පරිත්‍යාග කිරීම සඳහා වන වෛද්‍ය උපකරණ සහ ගල් අඟුරු ආනයනය වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

- රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය සඳහා වන යෙදවුම් සඳහා වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සියයට 2.5 ක් දක්වා අඩු කරන ලදී.

**ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ණය**

උතුරු පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමට අවශ්‍ය අතිරේක අරමුදල් සම්පාදනය සඳහා 2012 නොවැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ගිවිසුම් දෙකකට අත්සන් තබන ලදී.

**1. වි.ගැ.හි. මිලියන 45.2 ක ණය මුදල**

ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අමුදල් ක්‍රමය යටතේ වි.ගැ.හි. මිලියන 45.2 ක (ආසන්න වශයෙන් රු. බිලියන 8.96 ක) ණය මුදලක් ලබාදීමට එකඟතාව පළ කර ඇත. මෙම ණය

මුදල සඳහා සහන කාලය තුළදී වාර්ෂිකව සියයට 1 ක පොලී අනුපාතිකයක් ද, ඉන්පසුව වාර්ෂිකව සියයට 1.5 ක පොලී අනුපාතිකයක්ද අදාළ වේ. වසර 8 ක සහන කාලයකට යටත්ව වසර 32 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

## 2. එ.ජ.ඩොලර් මිලියන 30 ක ණය මුදල

ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන අරමුදල් ක්‍රමය යටතේ එ.ජ.ඩොලර් මිලියන 30 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 3.90 ක) ණය මුදලක් ලබා දීමට එකඟතාව පළ කර ඇත. මෙම ණය මුදල සඳහා සියයට 0.2 ක් හැර ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය මත වාර්ෂිකව සියයට 0.6 ක පොලී අනුපාතිකයක් සහ වාර්ෂිකව සියයට 0.15 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 26 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

## 3. කොරියානු ආනයන - අපනයන බැංකුවෙන් ලද ණය

පාදෙනිය-අනුරාධපුර මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2012 නොවැම්බර් මස 2 වැනි දින එ.ජ.ඩොලර් මිලියන 11.1 ක (ආසන්න වශයෙන් රු. බිලියන 1.45 ක) ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ කොරියානු ආනයන - අපනයන බැංකුව අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 0.15 ක් අදාල වේ. වසර 10 ක සහන කාලයට යටත්ව වසර 40 ක් තුලදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### 1 වන කොටස
# පුවත්පත් දැන්වීම්
### 2012 නොවැම්බර්

## 1. 2012 සැප්තැම්බර් මාසයේ විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය


*2012 වසරේ පළමු මාස නවය තුළ වෙළෙඳ හිඟය පෙර වසරේ අනුරූප කාලය සමඟ සැසඳීමේදී සියයට 0.3 කින් පහත වැටුණි. 2009 වසරේ දෙසැම්බර් මාසයෙන් පසු, වසර සඳහා වන සමුච්චිත වෙළෙඳ හිඟය පහත වැටුණු ප්‍රථම අවස්ථාව මෙය වේ.*


පුළුල් වෙමින් පැවැති වෙළෙඳ හිඟය පාලනය කිරීම සඳහා 2012 වසරේ පළමු භාගයේ දී ස්ථාපිත කරන ලද බහු-ආකාර ප්‍රතිපත්තිමය උපාය මාර්ග, ජංගම ගිණුමේ හිඟය අඩු කිරීමට උපකාරී වී ඇති බව ඒ අනුව පෙනී යයි. 2012 සැප්තැම්බර් මාසය තුළ දී අපනයන ආදායමෙහි පහත වැටීමේ වේගය අඩු වූ අතර, අඛණ්ඩව මාස තුනක් පුරා පහත වැටුණු තේ අපනයන ආදායම මෙම මාසය තුළ දී සතුටුදායක ක්‍රියාකාරිත්වයක් පෙන්වීම මේ සඳහා හේතු විය. මේ අතර, දැඩි ප්‍රතිපත්තිමය වාතාවරණයට ප්‍රතිචාර දක්වමින් 2012 සැප්තැම්බර් මාසයේ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 25.4කින් ශීඝ්‍ර ලෙස පහත වැටුණි.

2012 සැප්තැම්බර් මාසයේ පැවැති අඩු ආනයන වියදම මගින් විදේශීය මෙන්ම දේශීය ආර්ථික ප්‍රවණතාවය පිළිබිඹු කරයි. පාරිභෝගික භාණ්ඩ බොහොමයක් ආනයනය කිරීම සඳහා දැරූ වියදම පහත වැටුණු අතර, මෙම වසරේ පෙබරවාරි මාසයේ සිට රුපියල අවප්‍රමාණය වීම සහ පසුගිය මාස කිහිපය තුළ දී ණය ලබා ගැනීම් අඩුවීම හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. 2012 මාර්තු මාසයේ සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථ මත පනවනු ලැබූ ඉහළ බදු හේතුවෙන් මෝටර් රථ ආනයනය අඩුවීම, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීම සඳහා විශාල ලෙස දායක විය. සැප්තැම්බර් මස අන්තර් භාණ්ඩ ආනයන වියදම පහත වැටුණු අතර, තෙල් හැර අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයන සඳහා වූ වියදම අඩුවීම මේ සඳහා හේතු විය. ඇතැම් කාර්මික අපනයන සඳහා වූ ඉල්ලුම මෙන්ම මිල ගණන් පහළයාම මෙම පහත වැටීම මගින් පෙන්නුම් කරයි. ගෝලීය වෙළෙඳපොළේ කපු මිල ගණන් පහළයාම සහ 2011 වසරට සාපේක්ෂව ආනයන පරිමාවන් අඩුවීම යන හේතූන් නිසා රෙදිපිළි ආනයන ආදායම පහළ ගියේය. මේ අතර, ස්වර්ණාභරණ සඳහා වන ගෝලීය ඉල්ලුම අඩුවීම, 2012 සැප්තැම්බර් මාසයේ දියමන්ති හා රත්‍රං සඳහා වූ ආනයන වියදම අඩුවීමට හේතු විය. කෙසේ වුවද, තිරිඟු නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් කිහිපයක්ම පැවැති නියඟය නිසා ලෝක වෙළෙඳපොළේ තිරිඟු මිල ගණන් ඉහළයාම හේතුවෙන් තිරිඟු ආනයන සඳහා වූ වියදම ඉහළ ගියේය. ඛනිජ තෙල් ආනයන වියදම සැලකීමේ දී, සැප්තැම්බර් මාසයේ දී පිරිපහදු කරන ලද ඛනිජ තෙල් ආනයන වියදම ඉහළ ගියද, එම මාසයේ දී බොර තෙල් ආනයනය සිදු නොකිරීම නිසා ඛනිජ තෙල් නිෂ්පාදනය සඳහා වූ මුළු ආනයන වියදම පහළ ගියේය. මේ අතර, 2012 සැප්තැම්බර් මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය මෙන්ම ප්‍රවාහන උපකරණ සඳහා වූ වියදම අඩුවීමත් සමඟ ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම පහළ ගියේය.

2012 සැප්තැම්බර් මාසයේ දී කෘෂිකාර්මික හා ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම ඉහළ ගියද, මුළු අපනයන ආදායම සඳහා විශාලතම දායකත්වය ලබාදෙන කාර්මික අපනයන තුළින් වූ ඉපැයීම් පහළයාම හේතුවෙන් මුළු අපනයන ආදායම පහළ ගියේය. කෘෂිකාර්මික අපනයන කාණ්ඩයට අයත්වන එමෙන්ම මුළු වෙළෙඳ අපනයන ආදායමෙන් සියයට 14 කට පමණ දායකත්වයක් ලබාදෙන තේ, කුරුඳු හා ගම්මිරිස් ඇතුළු කුළු බඩු සහ ධාන්‍ය වර්ග ආදී වූ නොයෙකුත් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත තුළින් ඉපැයූ අපනයන ආදායම සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියේය. කාර්මික අපනයන සැලකීමේ දී මුළු අපනයන ආදායමට සියයට 35 කට වඩා දායකත්වයක් ලබාදෙන ඇඟළුම් අපනයන, සැප්තැම්බර් මාසයේදී ද තවදුරටත් අඩු ආදායම් වාර්තා කළ අතර, පසුගිය වසරේ මාර්තු මාසයේ සිට කපු මිල පහත වැටීම සහ ගෝලීය ඉල්ලුම පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව සැප්තැම්බර් මාසයේ අපනයන ආදායම පහත වැටීම සඳහා මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම පහත වැටීම සැලකිය යුතු ලෙස දායක විය.

ගෙවුම් තුලනයේ සේවා ගිණුම සහ ජංගම සංක්‍රාම වෙත වූ ලැබීම් සලකා බැලීමේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ අඛණ්ඩව ලැබෙන ප්‍රේෂණ සහ ඉහළ සංචාරක ඉපැයීම් හේතුවෙන් ජංගම ගිණුම තවදුරටත් ශක්තිමත් විය. 2012 වසරෙහි සැප්තැම්බර් මාසයේදී සංචාරක පැමිණීම් සංඛ්‍යාව 71,111ක් ලෙස වාර්තා වූ අතර, එය පසුගිය වසරෙහි පළමු මාස නවයට සාපේක්ෂව සියයට 16 කින්, 693,772 දක්වා වර්ධනය වූ අතර, සංචාරක ඉපැයීම් ද පසුගිය වසරට සාපේක්ෂව




අඛණ්ඩව ඉහළ යන ලදී. 2012 සැප්තැම්බර් මාසයේදී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පසුගිය වසරේ සැප්තැම්බර් මාසය හා සැසඳීමේදී එ.ජ.ඩොලර් මිලියන 511 ක් දක්වා සියයට 27.3 කින් වර්ධනය වූ අතර, 2012 වසරේ පළමු මාස නවය තුළදී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 4,419 ක් දක්වා සියයට 16.8 කින් වර්ධනය විය. වසර අවසානයේ දී සංචාරක ඉපැයීම් සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සාමාන්‍යයෙන් ඉහළ අගයක් වාර්තා කරන අතර, ඒ අනුව 2012 වසරේ අවසාන කාර්තුවේ දී ද මෙම ලැබීම් ඉහළ වර්ධනයක් ළඟා කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මූල්‍ය වෙළෙඳපොළ වෙත ගලා ආ විදේශ විනිමය ලැබීම් තුළින් 2012 වසරේ පළමු මාස නවය තුළ දී ගෙවුම් තුලනයේ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම අඛණ්ඩව ශක්තිමත් විය. 2012 වසරේ මේ දක්වා සෑම මාසයක් සඳහාම කොළඹ කොටස වෙළෙඳපොළ වෙත ශුද්ධ විදේශ ආයෝජන ලැබීම් වාර්තා විය. 2012 වසරේ පළමු මාස නවය තුළ දී රාජ්‍ය සුරැකුම්පත්හි විදේශීය ආයෝජන කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා වූ ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 820.7 ක් විය. මේ අතර, 2012 වසරේ පළමු මාස නවය තුළදී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 2,404 ක් විය. මීට අමතරව, 2012 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළදී වාණිජ බැංකුවල දිගුකාලීන ණය ගැනීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 927.5 ක් විය. කාර්තුමය පදනම මත ප්‍රකාශයට පත් කරනු ලබන, ආයෝජන මණ්ඩලය තුළ ලියාපදිංචි වූ සමාගම් වෙත ලැබුණ විදේශ ණය ඇතුළත් මුළු විදේශ සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණය 2012 වසරේ පළමු මාස හය තුළදී එ.ජ.ඩොලර් මිලියන 452 ක් ලෙස වාර්තා වී ඇති අතර, වසරෙහි ඉදිරි කාලපරිච්ඡේදය තුළදී වැඩි විදේශ ආයෝජන ලැබීම් ප්‍රමාණයක් අත්කර ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2012 සැප්තැම්බර් මාසය අවසාන වන විට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 7,053 ක් වූ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 8,610 ක් විය. විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2012 සැප්තැම්බර් මස අවසාන වන විට දී පැවැති දළ නිල සංචිත සහ මුළු විදේශීය සංචිත ප්‍රමාණය පිළිවෙලින් ආනයනික මාස 4.3 කට සහ 5.2 කට සමාන විය.

# සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - සැප්තැම්බර් 2012 (අ)

| | 2011 සැප්. එ.ජ.ඩො. මිලියන | 2012 සැප්. එ.ජ.ඩො. මිලියන | සැප්. වර්ධනය (සියයට) | 2011 ජනඃ සිට සැප්. එ.ජ.ඩො. මිලියන | 2012 ජනඃ සිට සැප්. එ.ජ.ඩො. මිලියන | ජනඃ සිට සැප්. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **858.4** | **801.5** | **-6.6** | **7,850.5** | **7,393.4** | **-5.8** |
| *මෙයින්,* | | | | | | |
| කෘෂිකාර්මික | 213.0 | 225.5 | 5.8 | 1,890.7 | 1,736.3 | -8.2 |
| *මෙයින්,* තේ | 121.5 | 141.1 | 16.2 | 1,104.4 | 1,031.6 | -6.6 |
| කාර්මික | 641.4 | 567.1 | -11.6 | 5,928.4 | 5,518.8 | -6.9 |
| *මෙයින්,* රෙදිපිළි හා ඇඟළුම් | 333.6 | 303.0 | -9.2 | 3,105.0 | 2,972.3 | -4.3 |
| රබර් නිෂ්පාදිත | 71.0 | 57.2 | -19.4 | 645.7 | 644.3 | -0.2 |
| ආහාර, පාන හා දුම්කොළ | 30.9 | 35.1 | 13.6 | 262.9 | 213.1 | -18.9 |
| ඛනිජ ද්‍රව්‍ය | 3.1 | 8.1 | 158.0 | 26.4 | 42.2 | 59.8 |
| **ආනයන** | **1,762.6** | **1,314.7** | **-25.4** | **14,649.6** | **14,173.4** | **-3.3** |
| *මෙයින්,* | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 303.5 | 206.1 | -32.1 | 2,686.5 | 2,291.7 | -14.7 |
| *මෙයින්,* ආහාර හා පාන වර්ග | 118.6 | 91.3 | -23.0 | 1,169.8 | 993.9 | -15.0 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 185.0 | 114.8 | -37.9 | 1,516.7 | 1,297.7 | -14.4 |
| අන්තර් භාණ්ඩ | 1,015.3 | 824.8 | -18.8 | 8,872.7 | 8,552.4 | -3.6 |
| *මෙයින්,* ඛනිජ තෙල් | 333.1 | 320.2 | -3.9 | 3,421.6 | 3,715.5 | 8.6 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 189.0 | 179.5 | -5.0 | 1,726.7 | 1,644.6 | -4.8 |
| ආයෝජන භාණ්ඩ | 437.4 | 280.0 | -36.0 | 3,052.9 | 3,305.9 | 8.3 |
| *මෙයින්,* යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 203.5 | 143.3 | -29.6 | 1,520.5 | 1,600.3 | 5.3 |
| ප්‍රවාහන උපකරණ | 115.6 | 52.0 | -55.0 | 737.0 | 818.3 | 11.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 117.9 | 84.4 | -28.4 | 792.6 | 883.3 | 11.4 |
| **වෙළෙඳ ශේෂය** | **-904.3** | **-513.1** | **-43.3** | **-6,799.1** | **-6,779.9** | **-0.3** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **401.6** | **511.2** | **27.3** | **3,782.1** | **4,418.6** | **16.8** |
| **විදේශීය සෘජු ආයෝජන (ආ)** | | | | **394.1** | **451.7** | **14.6** |
| **විවිධ ආයෝජන (ශුද්ධ)** | **-58.9** | **23.3** | | **-153.4** | **249.8** | |
| **වාණිජ බැංකු විසින් ලබා ගත් දිගුකාලීන විදේශ ණය** | | | | | **927.5** | |
| **සංචාරක ඉපැයීම්** | **58.4** | **68.8** | **17.9** | **580.1** | **711.1** | **22.6** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ)** | **250.9** | **188.6** | **-24.8** | **3,392.0** | **4,363.1** | **31.6** |
| *මෙයින්,* | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 92.7 | 87.1 | -6.0 | 866.5 | 1,954.5 | 125.6 |
| දිගු කාලීන ණය | 143.0 | 100.4 | -29.8 | 2,419.8 | 2,404.2 | -0.6 |

(අ) තාවකාලික

(ආ) ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගම් ලද විදේශීය ණය ද ඇතුළුව, විදේශීය සෘජු ආයෝජන ලැබීම්, වසරේ පළමු භාගය සඳහා වාර්තා කර ඇත.

(ඇ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

## 2. ශ්‍රී ලංකා ජපාන රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවයට හැට වසරක් පිරීම සැමරීම නිමිත්තෙන් නිකුත් කරනු ලබන සමරු කාසිය

- ශ්‍රී ලංකා ජපාන රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවයට හැට වසරක් පිරීම සැමරීම නිමිත්තෙන් රුපියල් 1000 මුහුණත වටිනාකමෙන් යුත් රිදී සමරු කාසියක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ඇත. ජපාන රජයේ ඉල්ලීම පරිදි ජපන් මින්ට් ආයතනය විසින් ටංකනය කරන පද මෙම කාසිය ශ්‍රී ලංකා මහ බැංකුවේ 57 වන සමරු කාසියයි. මෙම කාසිය 2012 නොවැම්බර් 12 වන දින ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත නිල වශයෙන් නිකුත් කෙරේ.

- කාසියේ ලක්ෂණ :




<u>මුහුණත</u>

* ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය බහුවර්ණයෙන් දැක්වේ.

* කාසියේ පහළ "2012" වර්ෂය ද "ශ්‍රී ලංකාව - ජපානය වසර 60 යි" යන්න සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පරිධියේ ද දැක්වේ.

<u>පිටුපස</u>

* 60 වන සංවත්සර නිල ලාංඡනය කාසිය මධ්‍යයේ දැක්වේ.

* කාසියේ මුහුණත වටිනාකම වන රුපියල් "1000" සහ "රුපියල්" යන්න කාසියේ පහළ ද "ශ්‍රී ලංකා" යන්න සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පරිධියේ ද දැක්වේ.

- කාසියේ විෂ්කම්භය මිලි මීටර් 35 ක් වන අතර බර ග්‍රෑම් 20.0 ක් වේ.

- කාසිය ආකර්ෂණීය ඇසුරුමක බහා ජපන් මින්ට් ආයතනයේ සත්‍යතා සහතිකයක් ද සමග නිකුත් කරනු ලැබේ.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් කාසියක් රුපියල් 12,500 බැගින් සීමිත කාසි ප්‍රමාණයක් අලෙවි කරනු ලබන අතර 2012 නොවැම්බර් 15 වන දින සිට කොළඹ 1 ජනාධිපති මාවතේ අංක 30 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙන්ද, රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු විදුපියසේ ස්ථාපිත මුදල් කෞතුකාගාරයෙන් ද, අනුරාධපුර, මාතර, මාතලේ, යාපනය හා ත්‍රිකුණාමලයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු පළාත් කාර්යාල වලින් ද මෙම කාසිය මිලදී ගත හැකිය.

- මෙම සමරු කාසිය තනිව හෝ එම කාසිය ඇතුලුව තවත් ජපන් කාසි 6 කින් සමන්විත කාසි කට්ටලයක් ජපන් ටංකනය විසින් අලෙවි කරනු ඇත. (වැඩි විස්තර සඳහා වන www.mint.go.jp බලන්න)

- වැඩි විස්තර සඳහා:

| | දුරකථන අංකය | ෆැක්ස් අංකය |
|---|---|---|
| ව්‍යවහාර මුදල් අධිකාරි | 0112477355 | 0112477726 |
| ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරි/ ව්‍යවහාර මුදල් | 0112477130/0112477364 | |
| විද්‍යුත් තැපෑල | currency@cbsl.lk | |
| මුදල් කෞතුකාගාරය, රාජගිරිය | 011 2477809 | |

පළාත් කාර්යාල

| | | | |
|---|---|---|---|
| අනුරාධපුරය | - | 025 2222048 | 0252225689 |
| මාතර | - | 041 2222268 | 0412222719 |
| මාතලේ | - | 066 2223367 | 0662222175 |
| යාපනය | - | 021 2221855 | 0212221857 |
| ත්‍රිකුණාමලය | - | 026 2242333 | 0262242332 |

## 11 වන කොටස

# පුවත්පත් දැන්වීම්

## 2012 නොවැම්බර්

### 3. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 නොවැම්බර්

*මෙතෙක් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි ඵලදායී බව පිළිබිඹු කරමින් පුළුල් මුදල් සැපයුමෙහි සහ පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණයෙහි වර්ධනය වසරේ තෙවන කාර්තුවේ දී තියුණු ලෙස අඩු වූ අතර, 2009 දෙසැම්බර් මාසයට පසුව ප්‍රථම වතාවට සමුච්චිත වෙළෙඳ හිඟය ද 2012 පළමු මාස නවයේ දී අඩු විය.*

මුදල් අංශයේ, පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2012 අප්‍රේල් මාසයේ දී වාර්තා කළ ඉහළම වර්ධනය වූ සියයට 22.9 සිට සැප්තැම්බර් මාසය වන විට සියයට 18.9 ක් දක්වා අඩු විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2012 මාර්තු මාසයට පෙර දක්නට ලැබුණු සියයට 35 ඉක්ම වූ ඉහළ වර්ධනයේ සිට සැප්තැම්බර් මාසය වන විට සියයට 25.5 ක් දක්වා අඛණ්ඩව පහත වැටුණි. 2012 පෙබරවාරි සහ මාර්තු මාසවල දී දක්නට ලැබුණු රුපියල් බිලියන 55 ඉක්මවූ මාසික වර්ධනයන්ට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි ප්‍රසාරණය රුපියල් බිලියන 10 කට වඩා අඩු අගයක පැවතුණි. රජයට ලබාදුන් ශුද්ධ ණය සහ රාජ්‍ය සංස්ථා වෙත ලබාදුන් ණය සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියේ අඩු අගයකින් වුවද, සමුච්චිත පදනම මත රාජ්‍ය අංශය විසින් ලබාගත් ණය පුරෝකථනය කරන ලද මට්ටම්වලට වඩා ඉහළ අගයක පැවතුණි. මෙම තත්ත්වය තුළ, 2013 අයවැය කථාවේ ප්‍රකාශ කළ පරිදි, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අඛණ්ඩව පවත්වා ගෙනයාම සඳහා රජයේ කැපවීම ඉදිරි වසරවල දී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පහසු කරවනු ඇත.

විදේශීය අංශයේ, 2012 පළමු මාස නවය තුළ සමස්ත වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 6,780 ක් දක්වා සියයට 0.3 කින් සංකෝචනය වූ අතර මේ සඳහා දුර්වල ගෝලීය ඉල්ලුම හේතුවෙන් අපනයන ආදායම සියයට 5.8 කින් පහළ ගිය ද ආනයන වියදම සැලකිය යුතු ලෙස සියයට 3.3 කින් පහළ යාම හේතු විය. පහත වැටුණු වෙළෙඳ හිඟය මෙන්ම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක ලැබීම් සහ ප්‍රාග්ධන ලැබීම් ආදියෙහි ඉහළයාම් හේතුවෙන් 2012 සැප්තැම්බර් අවසානයේ දී ගෙවුම් ශේෂය එ.ජ.ඩොලර් මිලියන 269 ක අතිරික්තයක් වාර්තා කළ අතර දළ නිල සංචිත ආනයනික මාස 4.3 ක් ආවරණය කිරීමට ප්‍රමාණවත් වෙමින් එ.ජ.ඩොලර් බිලියන 7.1 ක් දක්වා ඉහළ ගියේය.

ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම මන්දගාමීව සිදුවීම නිසා ඉල්ලුම් තත්ත්වයන් දුර්වල වීම, යූරෝ කලාපයේ ඇතැම් රටවල රාජ්‍ය මූල්‍ය විනයක් ඇති කිරීම සඳහා වන විවිධ ක්‍රියාමාර්ග පිළිබඳව ඇති දේශපාලන මත ගැටුම් සහ ආර්ථික පරිහානිය මධ්‍යයේ සක්‍රීය නායකත්වයක් නොමැති වීම යූරෝ කලාපයේ ආර්ථික ස්ථායීතාවයට අඛණ්ඩවම අහිතකර බලපෑම් ඇතිකරමින් ගෝලීය ආර්ථික වර්ධනය ද අඩාල කරමින් පවතී. ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපතිවරණය නිමාවීමත් සමගම ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීම වේගවත් කිරීමට ඇමෙරිකා එක්සත් ජනපදය සහ යූරෝ කලාපය සාමූහික ප්‍රයත්නයක් දරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙවන් තත්ත්වයන් හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ උද්ගත විය හැකි කැළඹිලිකාරී තත්ත්වයන්ට මුහුණ දීම සඳහා දියුණු සහ නැගී එන ආර්ථිකයන් බොහොමයක මහ බැංකු විසින් ඔවුන්ගේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයන් ලිහිල් කර ඇත.


උද්ධමනය පහත වැටීමේ ප්‍රවණතාව ඔක්තෝබර් මාසයේ දී ද අඛණ්ඩව පැවතුණු අතර, පහත වැටුණු ආහාර ද්‍රව්‍ය මිල ගණන් හේතුවෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය සැප්තැම්බර් මාසයේ වූ සියයට 9.1 සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 8.9 ක් දක්වා ආන්තික වශයෙන් පහත වැටුණි. අන්තර් මෝසම් වැසි ආරම්භ වීම නිසා කෘෂිකාර්මික නිෂ්පාදිතය ඉහළ යාමේ හැකියාවක් පවතින බැවින් ආහාර ද්‍රව්‍ය මිල ගණන් මත වන පීඩනය තවදුරටත් අඩුවීමේ ප්‍රවණතාවක් පවතී. ජලාශවල ජල මට්ටම ඉහළ යමින් පවතින බැවින් තාප විදුලි හා ජල විදුලි උත්පාදන අතර අනුපාතය සාර්ව ආර්ථිකයට වඩාත් හිතකර තත්ත්වයට පත්වී ඇත.

ඉහත සඳහන් කරන ලද ප්‍රවණතා පිළිබඳව සැලකිල්ලට ගනිමින් 2012 නොවැම්බර් මස 16 වැනි දින පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල රැස්වීමේ දී දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නොවෙනස්ව පවත්වා ගැනීම උචිත වන බව මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ඒ අනුව මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේම, එනම් ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 7.75 ක් සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 9.75 ක් ලෙස පවතිනු ඇත.

මීළගට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය සිදුකරනු ලබන දිනය යථාකාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.

## 4. 2012 නොවැම්බර් මාසයේ දී උද්ධමනය ඉහළ නගී

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007 = 100) මගින් මනිනු ලබන උද්ධමනය, ප්‍රධාන වශයෙන් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළයාම හේතුවෙන් ලක්ෂ්‍යමය පදනම මත 2012 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 8.9 හි සිට නොවැම්බර් මාසයේ දී සියයට 9.5 දක්වා ඉහළ නැගිණි. තවද, වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය 2012 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 6.8 හි සිට නොවැම්බර් මාසයේ දී සියයට 7.2 දක්වා ඉහළ නැගිණි.*




මූලික උද්ධමනය ලක්ෂ්‍යමය හා වාර්ෂික සාමාන්‍යය යන දෙයාකාරයේම පදනම මත පිළිවෙලින් පූර්ව මාසයේ පැවති සියයට 6.8 හා සියයට 5.4 හි සිට 2012 නොවැම්බර් මාසයේ දී සියයට 7.2 හා සියයට 5.6 දක්වා ඉහළ නැගිණි. කො.පා.මි. දර්ශක අගය 2012 ඔක්තෝබර් මාසයේ දී පැවති 165.0 හි සිට නොවැම්බර් මාසයේ දී 167.1 දක්වා නිරපේක්ෂ වශයෙන් වැඩි වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 1.3 කින් ඉහළ නැගිණි. ආහාර කාණ්ඩයේ මිල ගණන් වැඩිවීම (සියයට 2.4 කින්) දර්ශකයේ මෙම මාසික ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. බොහෝ එළවළු වර්ග, රතු ළූණු, ලොකු ළූණු, අර්තාපල්, පොල්, තිරිඟු පිටි සහ පාන් ආදියේ මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. කෙසේ වුවද, සමහර මත්ස්‍ය, කරවල හා පළතුරු වර්ගවල සහ බිත්තර මිල ගණන්හි පහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ රෙදිපිළි හා පාවහන් (සියයට 0.4 කින්); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.4 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 1.0 කින්) ප්‍රවාහන (සියයට 0.2 කින්); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.4 කින්); යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ නැගිණි. මේ අතර, සෞඛ්‍යය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

## 05. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2010, 2011 සහ 2012

(2006/07= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 |
| ජනවාරි | 140.4 | 149.2 | 154.8 | 1.9 | 1.4 | 0.3 | 7.1 | 6.2 | 3.8 | 3.2 | 6.1 | 6.5 |
| පෙබරවාරි | 141.1 | 151.3 | 155.4 | 0.5 | 1.4 | 0.4 | 7.5 | 7.2 | 2.7 | 3.3 | 6.1 | 6.1 |
| මාර්තු | 139.8 | 150.6 | 158.8 | -0.9 | -0.5 | 2.2 | 7.2 | 7.7 | 5.5 | 3.4 | 6.2 | 5.9 |
| අප්‍රේල් | 138.4 | 150.6 | 159.8 | -1.0 | 0.1 | 0.6 | 6.8 | 8.9 | 6.1 | 3.8 | 6.4 | 5.7 |
| මැයි | 140.1 | 151.5 | 162.1 | 1.2 | 0.6 | 1.4 | 5.6 | 8.2 | 7.0 | 3.9 | 6.6 | 5.6 |
| ජුනි | 141.2 | 151.2 | 165.2 | 0.8 | -0.2 | 1.9 | 5.1 | 7.1 | 9.3 | 4.3 | 6.7 | 5.8 |
| ජූලි | 141.2 | 151.7 | 166.7 | 0.0 | 0.4 | 0.9 | 4.4 | 7.5 | 9.8 | 4.6 | 7.0 | 6.0 |
| අගෝස්තු | 141.4 | 151.3 | 165.7 | 0.2 | -0.3 | -0.6 | 5.0 | 7.0 | 9.5 | 4.9 | 7.1 | 6.3 |
| සැප්තැම්බර් | 142.6 | 151.7 | 165.5 | 0.8 | 0.3 | -0.1 | 5.7 | 6.4 | 9.1 | 5.3 | 7.2 | 6.5 |
| ඔක්තෝබර් | 144.1 | 151.5 | 165.0 | 1.1 | -0.1 | -0.3 | 6.5 | 5.1 | 8.9 | 5.7 | 7.1 | 6.8 |
| නොවැම්බර් | 145.7 | 152.6 | 167.1 | 1.1 | 0.7 | 1.3 | 6.9 | 4.7 | 9.5 | 6.1 | 6.9 | 7.2 |
| දෙසැම්බර් | 147.2 | 154.4 | | 1.1 | 1.2 | | 6.8 | 4.9 | | 6.2 | 6.7 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව